(20)

ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அநுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி 4ம் மாடி B, ஹரிச்சந்திர வீதி, அநுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரணை / Inquiries: 025-2235790
Fax: 025-2224914
E-mail: csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/05/07/03
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.08. 05

ආයතන චක්‍රලේඛ ලිපි - 2022/02

උතුරු මැද පළාතේ සියළුම ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ,

ප්‍රධාන අභ්‍යන්තර විගණක ,

පළාත් ආදායම් කොමසාරිස් ,

<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම .</u>

උක්ත කරුණ සම්බන්ධව රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක EST-6/03/LEA/3162(1) හා 2022/07/26 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා සම්බන්ධවයි.

02. ඒ අනුව මෙම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන උතුරු මැද පළාත් සභාවට අදාළ කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙසත්, ඒ පිළිබඳව ඔබ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු ප්‍රධානින් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

i. රජයේ නිලධරයන්ට වැටුප් රහිත නිවාඩු ලබා දීම සම්බන්ධව දැනට ආයතන සංග්‍රහයේ පවතින විධිවිධානයන්ගෙන් බැහැරව , නැවත දැනුම් දෙන තුරු මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන ක්‍රියාත්මක වේ.

ii. මෙම චක්‍රලේඛය ප්‍රකාරව විදේශ නිවාඩු අනුමත කරන සෑම නිලධරයෙකුම එම චක්‍රලේඛයෙහි ඇමුණුම 01 හි සඳහන් ගිවිසුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර , එම ගිවිසුම් පත්‍රයෙහි සඳහන් කොන්දේසි සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්වරයා බැඳී සිටිය යුතුය , එම ගිවිසුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කොට , අදාළ නිලධාරියා හා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අත්සන් කිරීමෙන් පසු මා වෙත යොමු කළ යුතුය.

iii. මෙම චක්‍රලේඛයෙහි 04.ච වගන්තිය ප්‍රකාරව වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගන්නා සෑම නිලධාරියෙක්ම තමාගේ නමින් අනේවාසික විදේශ මුදල් ගිණුමක් (NRFC) ආරම්භ කළ යුතු අතර එම ගිණුමෙහි මුල් පිටුවෙහි සහතික කළ පිටපතක් අදාළ ඇමුණුම සමඟ මා වෙත යොමු කළ යුතුය.

iv. එසේම චක්‍රලේඛයේ "04.ඩ" වගන්තිය ප්‍රකාරව අදාළ මුදල් මාසිකව ප්‍රේෂණය කරන බවටත් "04.උ" වගන්තිය අනුව වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ දායක මුදල විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරනා බවට වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගන්නා සෑම නිලධාරියෙක්ම දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

v. එසේම මෙම විධිවිධාන යටතේ නිවාඩු ලබා දෙනු ලබන නිලධරයන්ගේ විස්තර ඇතුළත් වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්වරයා / ආයතන ප්‍රධානියා විසින් පවත්වා ගෙන යා යුතු අතර , අදාළ නිලධරයන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ පත්වීම් බලධරයන් වෙත මාසිකව වාර්තා කළ යුතුය

vi. ඒ අනුව ඉහත උපදෙස් පරිදි කටයුතු කර නිවැරදිව සම්පූර්ණ කරන ලද ආකෘතිපත්‍ර හා ඊට අදාළ ඇමුණුම්ද සමඟ අනුමැතිය සඳහා මා වෙත යොමු කරන ලෙස දැනුම් දෙමි.

vii. මෙම චක්‍රලේඛයෙහි විධිවිධානයන් කඩකරනු ලබන නිලධරයන් සම්බන්ධයෙන් චක්‍රලේඛයෙහි "04.ජ" වගන්තිය අනුව අමාත්‍යාංශ ලේකම්වරයා / ආයතන ප්‍රධානියා විසින් කටයුතු කළයුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර ,
ප්‍රධාන ලේකම් ,
උතුරු මැද පළාත.